(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 9.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 ජුනි 05 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ගරු තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා පිළිබඳ අමාත්‍යතුමා

**ගරු දයා ගමගේ මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

**ගරු නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියසේන ගමගේ මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වීරකුමාර දිසානායක මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා**

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා**

**ගරු තිලංග සුමතිපාල මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මහතා නියෝජ්‍ය කථානායක ධූරයෙන් ඉල්ලා අස්වී ඇති බව දන්වමින් ජනාධිපති ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත එවන ලද ලිපිය දැන් මහ ලේකම්වරයා විසින් මෙම සභාවට කියවනු ලැබේ."

ඊට අනුකූලව පහත සඳහන් ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කියවන ලදී:—

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/CSA/00/1/8/1/1

2018 මැයි මස 25 දින

ධම්මික දසනායක මහතා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

<u>නියෝජ්‍ය කථානායක ධුරය</u>

අතිගරු ජනාධිපතිතුමන්ගේ නියෝගය පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මැතිතුමා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ධුරයෙන් ඉල්ලා අස්වී ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

ඔස්ටින් ප්‍රනාන්දු
ජනාධිපති ලේකම්

M/Sec8

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873

ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657

ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

## II

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාර 'ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ විශේෂ විගණන වාර්තාවේ දසවැනි කාණ්ඩයේ XIII කොටස (ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව හා එහි පරිපාලනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව) පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 අප්‍රේල් 09 දිනැති අංක 2066/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 08/2018 දරන සුරාබදු නිවේදනය);

(v) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 අප්‍රේල් 06 දිනැති අංක 2065/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 09/2018 දරන සුරාබදු නිවේදනය); සහ

(vi) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 13 දිනැති අංක 2049/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

පිළිගන්වා, එම වාර්තා, නිවේදන සහ නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2017 වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(iii) 2017 වර්ෂය සඳහා කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව; සහ

(iv) 2017 වර්ෂය සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2014 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පීඨයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 පෙබරවාරි 08 දිනැති අංක 2005/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 අගෝස්තු 09 දිනැති අංක 2031/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. **කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වඩිවේල් සුරේෂ් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ නියමයන්;

(iv) 2014 සහ 2015 වර්ෂ සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තා;

(v) 2015 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව;

(vi) 2016 වර්ෂය සඳහා කම්කරු, වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(vii) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තා;

(viii) 2015 වර්ෂය සඳහා මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ix) 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

4. **පෙත්සම් :**

(1) ගාල්ල, තල්ගස්වල, මානම්පිට, අංක 171 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. ඉෂාන් ඉන්දික මහතාගෙන් ලැබුණු 2018.03.02 දිනැති පෙත්සම ගරු ගයන්ත කරුණාතිලක මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) අළුබෝමුල්ල, පමුණුගම, දිගනතුඩුව, අංක 372 දරන ස්ථානයෙහි පදිංචි අයි. සී. පෙරේරා මහතාගෙන් ලැබුණු 2018.01.31 දිනැති

පෙත්සම; සහ

(ii) ඉංගිරිය, තානායම් පෙදෙස, අංක 204 ඩී/6 දරන ස්ථානයෙහි පදිංචි තිලක් වීරකෝන් මහතාගෙන් ලැබුණු 2016.10.23 දිනැති පෙත්සම

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මහගම, දියකඩුව, 4 කණුව අසල පදිංචි කේ.ජී. රේණුකා මහත්මියගෙන් ලැබුණු 2017.12.28 දිනැති පෙත්සම ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(4) ඒකළ, මඩම හන්දිය, ගම්පහ පාර, අංක 196 1/2 දරන ස්ථානයෙහි පදිංචි ජී. ජයතිස්ස මහතාගෙන් ලැබුණු 2018.02.16 දිනැති පෙත්සම ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(5) ගනේමුල්ල, කටුවාලමුල්ල, භාවනා මධ්‍යස්ථාන පාර, අංක 23/3ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී. එච්. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2017.12.22 දිනැති පෙත්සම ගරු එස්. බී. දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) පොල්ගහවෙල, ගොඩවෙල, අංක 192 දරන ස්ථානයෙහි පදිංචි බී. ඒ. ජිනපාල අමරසිංහ මහතාගෙන් ලැබුණු 2018.02.12 දිනැති පෙත්සම; සහ

(ii) නාගොල්ලාගම, ගල්ලැව, "විකුණුම්සිරි" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. කරුණාවතී මහත්මියගෙන් ලැබුණු 2017.06.19 දිනැති පෙත්සම

ගරු සාලින්ද දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(7) දොඩන්ගොඩ, නැහින්න, වඩුගම පාර යන ලිපිනයෙහි පදිංචි ජේ. කේ. ආරියරත්න මහතාගෙන් ලැබුණු 2017.05.14 දිනැති පෙත්සම ගරු කුමාර වෙල්ගම මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) නුගේගොඩ, උඩහමුල්ල, දුම්රිය පාර, අංක 150 දරන ස්ථානයෙහි පදිංචි එච්. එන්. ජේ. පීරිස් මහතාගෙන් ලැබුණු 2018.03.05 දිනැති පෙත්සම;

(ii) කඳාන, රිලවුල්ල, මීගමු පාර, අංක 168 දරන ස්ථානයෙහි පදිංචි ජේ. එම්. මයිකල් පෙරේරා මහතාගෙන් ලැබුණු 2018.01.29 දිනැති පෙත්සම; සහ

(iii) දිවුලපිටිය, පහළ හපුවලාන, අංක. 146/3 දරන ස්ථානයෙහි පදිංචි නිරන්ජන් විජේගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2018.03.30 දිනැති පෙත්සම

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(9) බලපිටිය, නවරත්නාගොඩ, අංක 198 දරන ස්ථානයෙහි පදිංචි ධනසිරි එස්. ගලප්පත්ති මහතාගෙන් ලැබුණු 2017.12.13 දිනැති පෙත්සම ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් පිළිගන්වන ලදී.

(10) (i) උස්වැව, වරායාය, අංක 843 දරන ස්ථානයෙහි පදිංචි ඒ. පී. දිනූකා නිමාලි මහත්මියගෙන් ලැබුණු 2018.04.24 දිනැති පෙත්සම; සහ

(ii) දික්වැල්ල, පොල්ගහමුල්ල, "ජයනිවස" යන ලිපිනයෙහි පදිංචි පී. ඒ. කරුණාසේන මහතාගෙන් ලැබුණු 2018.01.23 දිනැති පෙත්සම

ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(11) කළුතර, බෝම්බුවල, වැලිගොඩැල්ල, සම්පත් ජීවරත්න මාවත යන ලිපිනයෙහි පදිංචි ඒ. චම්පිකා දමයන්ති මහත්මියගෙන් ලැබුණු 2018.04.18 දිනැති පෙත්සම ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා විසින් පිළිගන්වන ලදී.

(12) ගාල්ල, වක්වැල්ල පාර, අංක 58/8 දරන ස්ථානයෙහි පදිංචි බී. ආර්. විමලසේන මහතාගෙන් ලැබුණු 2018.01.25 දිනැති පෙත්සම ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(13) කොළඹ 15, කාක දූපත, මට්ටක්කුලිය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි ලෙස සේවය කරන එච්. කේ. රෂින්ත තුෂාර මහතාගෙන් ලැබුණු 2017.03.02 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(14) පොළොන්නරුව, නිශ්ශංක මල්ල පාර, රංකොත් වෙහෙර ඉදිරිපිට පාර, අංක 19/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එම්. සුනිල් අධිකාරි මහතාගෙන් ලැබුණු 2018.01.11 දිනැති පෙත්සම ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. නියෝජ්‍ය කථානායකවරයා හා කාරක සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කිරීම :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතාගේ නම නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපති ධූරය සඳහා තෝරා පත්කර ගැනීම පිණිස යෝජනා කළෙන් ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු එස්. බී. දිසානායක මහතා, ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ නම නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපති ධූරය සඳහා තෝරා පත්කර ගැනීම පිණිස යෝජනා කළෙන් ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

පාර්ලිමේන්තුවේ අංක 6 දරන ස්ථාවර නියෝගය සමඟ කියවිය යුතු පාර්ලිමේන්තුවේ අංක 4 (ඈ) දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයෙකු තෝරා පත් කිරීමෙහි පාර්ලිමේන්තුව නිරත විය.

ඡන්ද පත්‍රිකා ගණන් කොට, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්දය විමසීමේ ප්‍රතිඵලය මතු පළවන අන්දමට පාර්ලිමේන්තුවේ කථානායකවරයා විසින් ප්‍රකාශ කරන ලදී:—

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා ඡන්ද 97

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ඡන්ද 53

ඡන්දය ප්‍රකාශ නොකළ සංඛ්‍යාව 72

ප්‍රතික්ෂේපිත ඡන්ද 1

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයා වශයෙන් නිසි පරිදි ඡන්දයෙන් තෝරා පත් කරන ලද බව කථානායකවරයා විසින් ප්‍රකාශ කරන ලදී.**

**6. සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) :** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2018 ජූනි 19 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි , පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 5.13 ට, 2018 ජූනි 06 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.